ලිංගික අපරාධයක් වාර්තා කිරීමේදී ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු මාධ්‍ය ආචාර ධර්මයන් මෙන්ම සමාජ ආචාර ධර්මයන්ද තිබේ. එම සීමා මායිම් උල්ලංඝනය නොකිරීම වැදගත් වන්නේ, පළමුකොටම එවැනි සීමාවන් සම්මත කොටගෙන ඇත්තේ වින්දිත පාර්ශවයන්ට අගතියක් හෝ අමතර සිත්වේදනාවන් හෝ ඇතිවීම වැළැක්වීම අරමුණු කරගනිමින් වන බැවිනි.

මාගම ප්‍රදේශයේ සිදුවූ කණගාටුදායක සිදුවීමක් විවිධ මාධ්‍යයන් ඔස්සේ වාර්තා කර තිබූ ආකාරය දෙස මෙහිදී අවධානය යොමු කිරීම වටී. මෙහිදී බාලවයස්කාර දැරියක් සමූහ අපයෝජනයකට ලක් වී තිබිණි. ඉන් පසුව සියදිවි හානි කරගැනීමට ගත් ප්‍රයත්නයකින් පසුව ඇය රෝහල්ගත කළ අතර, ඉන් පසු ඇය මියගොස් තිබේ. මෙම සිදුවීම වාර්තා කළ බොහෝ පුවත්පත් මගින් ඇය සියදිවි හානිකරගැනීමට තැත් කළ ආකාරය, ඇගේ ඡායාරූප, මියයෑමට පෙරාතුව ඇය ලියූ ලිපිය යනාදිය ප්‍රවෘත්තිය තුළ ප්‍රසිද්ධ කර තිබිණි. එසේම උපකාරක අංක සඳහන් කිරීමක්ද දක්නට නොවිණි. මෙයට අමතරව කෙළෙසීම, දූෂණය යනාදී වදන්ද භාවිතා තිබෙනු නිරීක්ෂණය කිරීමට හැකිවිණි.

ඉහත දැක්වූ සියල්ල නොකළ යුතු කාරණාවන් ලෙසින් ගොනු කිරීමට හැකි අතර, මෙවැනි ප්‍රවෘත්තියක් හා සමගින් උපකාරක සේවා අංකයන් සඳහන් කිරීමද වඩාත් යෝග්‍ය වන බව සඳහන් කළ යුතුවේ. එසේම දූෂණය හෝ කෙළෙසීම වැනි වදන් වෙනුවට ලිංගික අපරාධය, අපචාරය හෝ අපයෝජනය වැනි වදන් භාවිතය යෝග්‍ය වේ.

මෙහිදී මෙම ආචාර ධර්මයන් සහ වඩාත් යෝග්‍ය යැයි අප සඳහන් කළ මාධ්‍ය භාවිතාවන් පිළිපදිමින් මෙම සිදුවීම අද පුවත්පත මගින් වාර්තා කර තිබූ ආකාරය දෙස අවධානය යොමු කිරීම වටී. එය සැබවින්ම ප්‍රශංසා කටයුතු වේ. එසේම ටීවී දෙරණ වැඩසටහනක් වන දෙරණ අරුණ මගින්ද මෙම ප්‍රවෘත්තිය මනා සංයමයකින් යුතුව ඉදිරිපත් කොට තිබූ අතර, විශේෂයෙන්ම වින්දිත දැරියගේ නම හෝ අනන්‍යතාවය හෙළිදරවු වන වෙනත් විස්තරද නොදක්වා සිටීමට ප්‍රවේසම් වීම ඉස්මතු කොට දැක්විය යුතු වේ. නිවැරදි මාධ්‍යකරණය නම් මෙයයි.
**#mediaethicsSL #lka #SinhalaChannel #SinhalaPress #Divaina #Rivira #Ada #DeranaAruna #January15**